මාධ්‍ය නිවේදන අංක 08

# මැතිවරණ කොමිෂන් සභාව

අද රට තුළ පවතින තත්ත්වය මත ජනතාව පත්ව ඇති අතිදුෂ්කර තත්ත්වය පිළිබඳවත්, පවතින ක්‍රියාකාරකම් පිළිබඳවත් මැතිවරණ කොමිෂන් සභාව බලවත් සංතාපයට පත්ව ඇත. දශක කිපයක් තිස්සේ පැවති දේශපාලන ක්‍රියාදාමය මෙයට හේතු සාධක වී ඇති බව නිරීක්ෂණය කරන මැතිවරණ කොමිෂන් සභාව ප්‍රශස්ත දේශපාලන ක්‍රියාවලියකට මඟ පෙන්වන මැතිවරණ ක්‍රියාවලියක් නොමැති වීම ද, මේ සඳහා හේතුකාරක තවත් එක් සාධකයක් වන බව ද අවධානයට ගනී. මහජන නියෝජිතයන් නැවත කැඳවීමට ජනතාවට බලය ලබාදීම හා මැතිවරණයක දී දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් විසින් කරනු ලබන අතිදැවැන්ත ධනස්කන්දයට සීමා පනවන, රාජ්‍ය සම්පත් අයුතු භාවිතය වළකන, කාන්තාවන් හා තරුණයන් නියෝජනයට ප්‍රමාණවත් ඉඩ සලසන සහභාගීත්ව නියෝජනයට සාධාරණ අවස්ථා ලබාදෙන, අමාත්‍යවරුන් හා මන්ත්‍රීවරුන්ගේ අධි වරප්‍රසාද සීමා කරන මැතිවරණ නීති සංශෝධන මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ ද වඩාත් ඵලදායී ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් ස්ථාපිත කරලීම සඳහාය.

ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක හරය, සම්මුතිය හා එකඟතාව වන බව මැතිවරණ කොමිෂන් සභාව සලකනු ලබන අතර, මේ අවස්ථාවේ පවතින ආර්ථික හා දේශපාලන අර්බුදය හමුවේ රටේ අනාගතය ගැන සිතන සියලුම දේශපාලන පක්ෂ හා වෙනත් සංවිධාන විසින් සම්මුතිකාමී එකඟතාවට පැමිණ විසඳුම් සඳහා යොමු විය යුතු බව ද නිරීක්ෂණය කරමු. නිශ්චිත දේශපාලන හා ආර්ථික වැඩපිළිවෙලක්, නිශ්චිත කාල රාමුවක් තුළ ක්‍රියාත්මක කිරීමට විශේෂයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂවලට මේ අවස්ථාවේ මඟහැරිය නොහැකි වගකීමක් පැවරෙන බව හා එය ඉටු නොවීම තුළ ප්‍රජාතන්ත්‍රවාදී නොවන බලවේගවලට රට අරාජික කිරීමට හෝ මැදිහත් වීමට හෝ අවස්ථා විවර වීම පිළිබඳව ද එම පක්ෂ අවධානයට ගනු ඇතැයි මැතිවරණ කොමිෂන් සභාව විශ්වාසය පළ කරයි. මෙම අවස්ථාව කළමනාකරණය කරනු ලබන ක්‍රමවේදය රටේ අනාගතය, මෙන්ම දේශපාලන පක්ෂ සම්බන්ධව ද තීරණාත්මක වනු ඇත. ප්‍රජාතන්ත්‍රවාදීව හා සාමකාමීව ඉදිරිපත් කරනු ලබන ජනතා අදහස්වලට සවන් දීම දේශපාලන පක්ෂ සතු වගකීමක් වන බව හා එය නොසලකා හැරීම හෝ එම ජනතා අයිතිය තම පටු අරමුණු සඳහා යොදා ගැනීමට තැත් කිරීම තුළ,බරපතල ව්‍යසනයක් ඇති වීමේ අවදානම පිළිබඳව ද මැතිවරණ කොමිෂන් සභාව දේශපාලන පක්ෂවල අවධානය යොමු කර සිටී.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

එච්.එම්.ටී.ඩී.හේරත්
ලේකම්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2022 අප්‍රේල් මස 18